ශ්‍රේණිය :- 11ශ්‍රේණිය

කොවිඩ් - 19 සති පාසල (I වන සතිය)

විෂය :- සිංහල භාෂාව හා සාහිත්‍යය

පාඩම :- ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්

(01). පාඩම කියවා "ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්" මහතා පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

සිංහල භාෂාව හා සාහිත්‍යය (සාහිත්‍යය සංග්‍රහය)

පාඩම :- අඟුල්මල් දමනය

(01). මෙම පාඩම කියවා අමාරු වචන ලියා හැකි ඒවායේ තේරුම් ලියන්න.

(02). මෙම කථාව ඔබේ වචනයෙන් ලියන්න.

(03). පහත චරිත ගැන කෙටි විස්තර ලියන්න.

1. අහිංසක
11. දිසාපාමෝක් ඇදුරුතුමා

විෂය :- විද්‍යාව

ඒකකය :- මානව දේහ ක්‍රියාවලි

1) 11 ශ්‍රේණිය පෙළපොත පිටු අංක (140-141) හොඳින් කියවා අවබෝධ කරගන්න.මිනිසාගේ ආහාර ජීර්ණ පද්ධතියේ රූප සටහන A4 කඩදාසියක පැහැදිලිව ඇඳ කොටස් නම් කරන්න.

2) පිටු අංක (142) හොඳින් කියවන්න.මුඛ කුහරය තුල සිදුවන ජීර්ණය අවබෝධ කරගන්න.

3) පිටු අංක (143-146) ඇති ආමාශය, ක්ෂුද්‍රාන්ත්‍රය, හා මහාන්ත්‍රය තුල සිදුවන ක්‍රියාවලි අවබෝධ කරගන්න.(6.1) වගුව ආකාරයේ වගුවක් පිටපත් කර විෂය කරුණු මතකයෙන් එහි සටහන් කරන්න.

4) ආහාර ජීර්ණ පද්ධතිය ආශ්‍රිත රෝග හා ආබාධ පිළිබඳ සොයා බලා කරුණු එකතු කරන්න.

5) පෙළ පොතෙහි (186) පිටුවෙහි අභ්‍යාසයෙහි (1) ප්‍රශ්නයට හා අපොස (සාපෙ) 2011 ප්‍රශ්න පත්‍රය 4(B) කොටසට පිළිතුරු සපයන්න

විෂය :- නර්තනය

1) මාත්‍රා 3+4 දෙතිත සහ මාත්‍රා 3 තනි තිත අනුව නර්තනය කරන වන්නම නම් කරන්න.
2) එම වන්නමේ මාත්‍රා 3න් 3ට ගායනා කරනු ලබන පළමුවන කවියේ කොටස සම්පූර්ණයෙන් ලියා දක්වන්න.
3) එම වන්නමට අයත් කස්තිරම සහ සීරුමාරුව අදාල තිතට ප්‍රස්තාර කරන්න.
4) ඊට අයත් අඩව්ව අදාල තාල රූපය අනුව තාල තබමින් හඬ නඟා පද උච්ඡාරණය කරන්න.
5) තානම ගායනා කරමින් අදාල තාල රූප අනුව ගොඩ සරඹ 2 සහ 3 නර්තන අභ්‍යාසයේ යෙදෙන්න.

විෂය :- නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය

4 වන පාඩම - යතුරු පැදියක විදුලි පද්ධතිය

1. a. බැටරියක් යතුරු පැදියෙන් ගැලවීමේදී පළමුව ගැලවිය යුත්තේ කුමන අග්‍රයද?
   b. එයට හේතුව කුමක්ද?
2. යතුරු පැදියට අලුතින් බැටරියක් සවි කිරීමේදී මුලින් සම්බන්ධ කල යුතු අග්‍රය කුමක්ද?
3. a. යතුරු පැදියකට සංඥා පහන් පරිපථයේ අවශ්‍යතාව කුමක්ද?
   b. සංඥා පහන් පරිපථයේ පරිපථ සටහන ඇඳ නම් කරන්න.
4. a. තිරිංග පහන් වල අවශ්‍යතාව කුමක්ද?
   b. මෙම තිරිංග පහන් ක්‍රියාත්මක වන්නේ කෙසේද?
   c. මෙම පහන් සඳහා භාවිතා වන විදුලි බුබුළු පිළිබඳව පැහැදිලි කරන්න.

SUBJECT :- ENGLISH

1.Refer to the activity 6 on page 40 of your text book. Write 10 things your family members said during this coronavirus time.

1. Convert the same statements into reported speech. Eg:- My father said

that covid 19 was a deadly disease.

2. Do the activity 4 on page 30 of your workbook regarding reported speech.
3. Write 5 positive instructions and 5 negative instructions that you can give to your friends.
Eg:- Wash your hands with soap – positive

Don't pick flowers

විෂය :- නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය

3 වන පාඩම - බර දරන හා බර නොදර ඉදිකිරීම්

මිනිසාගේ බොහෝ අවශ්‍යතා සඳහා මිනිසා විසින් සරල මෙන්ම සංකීර්ණ ඉදිකිරීම් නිපදවීම් සිදු කරයි. ඉන් සමහරක් ඒවාට බර යෙදීමක් කරන අතර ඇතැම් ඒවාට බර යෙදීමක්සිදු නොවේ.

1. ඔබගේ නිවසේ ඇති ඉදිකිරීම් හෝ නිපදවීම් අධ්‍යයනය කර බර දරා සිටින හා බර දරා නොසිටින ලෙස වෙන් කර දක්වන්න.
   උදා: බර දරා සිටින : දොර උළුවස්ස
   බර දරා නොසිටින : දොර පියන

2. දැව හෝ ලෝම රාමුව සහිත පුටුවක්, මේසයක්, අල්මාරියක් වැනි ගෘහ භාණ්ඩයක් අධ්‍යයනය කර පහත කරුණු නිරීක්ෂණය කර කෙටියෙන් විස්තර කරන්න.
   - නොසෙල්වීමට යොදා ඇති උපක්‍රම
   - ශක්තිමත් බව හා බර දැරීමට හැකිවන සේ තනා ඇති ක්‍රමය
   - වැඩිකාලයක් පැවතීම සඳහා යොදා ඇති උපක්‍රමය
   - එම ගෘහ භාණ්ඩයට ස්ථිර හැඩයක් සිටින සේ කොටස් එකලස් කර ඇති ආකාරය
   - සම්පත් අරපිරිමැස්මට අනුගමනය කර ඇති ක්‍රියාකාරකම
   - පහසුවෙන් භාවිතයට ගතහැකි වනසේ නිපදවා ඇති ආකාරය
3. ගොඩනැගිල්ලක දල සැලැස්මක් ඇඳ බර දරන මුලික කොටස් හා යොදාගෙන ඇති අමුද්‍රව්‍ය නම් කරන්න.
4. ඉදිකිරීමක මුල අවයව නිර්මාණයේදී නිර්මනශිල්පියා සැලකිලිමත්වන කරුණු මොනවද?

විෂය :- ශිල්ප කලා

4 වන පාඩම - සකපෝරුව භාවිතයෙන් භාණ්ඩ නිපදවීම

11 ශ්‍රේණිය පෙළපොතේ පිටු අංක 94 – 101 දක්වා හොඳින් අධ්‍යයනය කිරීමෙන් පසු පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න.

1. උසස් ප්‍රමිතියෙන් යුත් මැටි භාණ්ඩයක් නිර්මාණය කිරීම සඳහා මැටි පදම් කිරීම අවශ්‍ය වේ. මැටි දෙඅතින් නිවැරදිව පදම් කරන ක්‍රම දෙක නම් කර ඒවා වෙන් වෙන්ව පැහැදිලි කරන්න.
2. මැටි භාණ්ඩ නිර්මාණයේදී සකපෝරුවේ භාණ්ඩ නිර්මාණය කිරීම "ඉදිකිරීම" ලෙස හඳුන්වන අතර සකපෝරු භාවිතයෙන් වෘත්තාකාර හෝ සිලින්ඩරාකාර මැටි බඳුන් නිර්මාණය කරයි.
   a. සකපෝරු වර්ග කීයද?
   b. ඒ මොනවද?

3. සකපෝරුව මගින් භාණ්ඩ ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මොනවද?
4. සකපොරුවක මැටි භාණ්ඩයක් ඉදිකිරීමේ ප්‍රධාන පියවර අනුපිළිවෙලින් ලියන්න.
5. ඉහත සඳහන් කල ප්‍රධාන පියවර වෙන් වෙන්ව පැහැදිලි කරන්න.

GRADE 11 - MATHS

PERCENTAGES

Calculating interest on the reducing balance

- Anupama has borrowed Rs.5000 as a business loan from a financial institution that charges a monthly interest rate of 2%. The loan has to be paid back in five monthly installments.
- Amount due from the principal loan per month without interest = $\frac{Rs.5000}{5}$
  = Rs.1000
- In this method, the outstanding loan balance is reduced by Rs.1000. Every month and interest is charged only on the loan balance.

Month	The loan amount	Interest charge for a month	The number of month units that the loan is paid
First month	Rs.5000	$Rs.5000 \times \frac{2}{100} = Rs.100$	5
Second month	Rs.4000	$Rs.4000 \times \frac{2}{100} = Rs.80$	4
Third month	Rs.3000	$Rs.3000 \times \frac{2}{100} = Rs.60$	3
Fourth month	Rs.2000	$Rs.2000 \times \frac{2}{100} = Rs.40$	2
Fifth month	Rs.1000	$Rs.2000 \times \frac{2}{100} = Rs.20$	1
	Total	= Rs.300	15

Interest paid for a month unit $= Rs.2000 \times \frac{2}{100} = Rs.20$

The number of month units that the loan is paid over = 15

Total interest paid =Rs.20 x 15 = Rs. 300

EXAMPLE

Amount due from the principal loan per month without interest = $Rs.\frac{5000}{5}$

$= Rs.1000$

Interest paid for a month unit $= Rs.1000 \times \frac{2}{100}$

$= Rs.20$

The number of month units $= \frac{5}{2}(5 + 1) = 15$

Total interest paid $= Rs.20 \times 15$

$= Rs.300$

The amount of an installment $= \frac{Rs.5000 + Rs.300}{5}$

Mr.Kalhara has borrowed Rs.60000 as a business loan from a bank that charges an annual interest rate of 36%. The loan has to be paid back in six equal monthly installments and the interest is calculated on the reducing balance. Calculate the value of a monthly installment.

Amount due from the principal loan per month without interest $= \frac{Rs.6000}{\dots\dots\dots}$ = Rs. ....

Interest paid for a month unit $= Rs \dots \times \frac{36}{100} \times \frac{1}{12}$

$= Rs \dots\dots\dots$

The number of month units

$= \frac{12}{\dots\dots}(\dots.+1) = 78$

Total interest paid $= Rs. \dots . \times Rs \dots ..$

Do the exercise 9.1

විෂය :- ගෘහ ආර්ථික විද්‍යාව

2 වන පාඩම - ගෘහිය සම්පත් කළමනාකරණය

ක්‍රියාකාරකම සඳහා උපදෙස්

- ඔබ නිවසේ පැවැත්වූ උත්සව අවස්ථාවක් පහත සඳහන් කරුණු යටතේ නැවත මතක් කරගන්න.
  - උත්සවය පැවැත්වූ දිනය
  - එදින සිදුවූ කාර්යයන්
  - යොදාගත් සම්පත්
  - එහි සාර්ථක බව හා ඇතිවූ ගැටළු
- පෙලපොතේ 2වන පාඩම වන "ගෘහිය සම්පත් කළමනාකරණය" පිටු අංක 16 සිට 22 දක්වා හොඳින් කියවා ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

1. "කළමනාකරණ ක්‍රියාවලිය" අර්ථ දක්වන්න.
2. කළමනාකරණ ක්‍රියාවලියේ පියවර සඳහන් කරන්න.
3. පිටු අංක 17 සිට 22 දක්වා අධ්‍යයනය කර පහත වගුව සම්පූර්ණ කරන්න

සම්පත් වර්ගය	සැලසුම් කිරීම	අවධානය යොමු කල යුතු කරුණු
උදා: කාලය ශ්‍රමය මුදල්	කාලසටහන මගින්.	

4. ගෘහීය දෛනික කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ වාසි සඳහන් කරන්න.
5. ගෘහයට ලැබෙන අදායම් හා වියදම් පිලිබඳ සොයා බලා මැයි මාසය සඳහා ගෘහීය අය වැය ලේඛනයක් සැලසුම් කරන්න.
6. වර්තමානයේදී ඇති වූ කොරෝනා රෝගයෙන් වැලකීම සඳහා ඔබ පවුලේ සාමාජිකයින් ක්‍රියාත්මක වූ ආකාරය සඳහන් කරන්න.
7. ඔබ නිවසේ පැවැත්වූ උත්සව අවස්ථාවක් (උපන්දින/අවුරුදු/ වෙනත්) සඳහන් කර එම කාර්යය සාර්ථක හා අසාර්ථක බවට හේතු වූ කරුණු සඳහන් කර අසාර්ථකතත්වයන් මගහරවා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න.
8. ගෘහීය සම්පත් කළමනාකරණයේ වැදගත්කම පෙන්වා දෙන්න.

විෂය :- කෘෂි හා ආහාර තාක්‍ෂණය

4 වන පාඩම - කෘෂි භෝගවල පසු අස්වනු හානිය

ක්‍රියාකරම සඳහා උපදෙස්

- 11 ශ්‍රේණිය පෙලපොතේ පිටු අංක 56 – 60 දක්වා අධ්‍යයනය කරන්න.

"සංවර්ධිත රටවල පසු අස්වනු හානිය 10% යි. සංවර්ධනය වෙමින් පවතින රටවල එය 20%- 40% දක්වා ඉහල අගයක් ගනී."

1. පසු අස්වනු හානිය යන්න හඳුන්වන්න.
2. පසු අස්වනු හානිය කෙරෙහි අපගේ අවධානය යොමු කිරීමේ වැදගත්කම සොයා බලන්න.

පසු අස්වනු හානිය කෙරෙහි බලපාන සාධක ප්‍රධාන කාණ්ඩ දෙකකි.

I. **පෙර අස්වනු සාධක**
II. **පසු අස්වනු සාධක**

3. ඉහත සඳහන් සාධක දෙක කෙටියෙන් හඳුන්වන්න.
4. පසු අස්වනු සාධක තවදුරටත් අභ්‍යන්තර හා බාහිර සාධක ලෙස ආකාර දෙකකි. ඒවා වෙන වෙනම හඳුන්වන්න.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - පැවරුම් අංක 01

(පද්ධති සංවර්ධන ජීවන චක්‍රය)

1) පද්ධතියක් යනු කුමක්ද?
2) a- පද්ධතියක මූලික සංඝටක කීයද?
   b- ඒවා නම් කරන්න.
   c- පද්ධතියක මූලික සංඝටක රූප සටහනක් මගින් දක්වන්න.
   d- සාමාන්‍ය පරිසරයේ ඔබ හඳුනාගත් පද්ධති 03ක් නම් කර ඒවායේ මූලික සංඝටක වෙන වෙනම දක්වන්න.
3) a- තොරතුරු පද්ධතියක් යනු කුමක්දැයි හඳුන්වන්න.
   b- තොරතුරු පද්ධතියක මූලික සංඝටක රූප සටහනක් මගින් දක්වන්න.
4) තොරතුරු පද්ධතියක් ප්‍රධාන ලෙස අත්යුරු තොරතුරු පද්ධතියක් සහ පරිගණක පාදක තොරතුරු පද්ධතියක් ලෙස වර්ග කළ හැක. මේවා අතර මූලික වෙනස්කම් වගු ගත කරන්න.
5) සාමාන්‍ය ජීවිතයේදී ඔබට හමුවන පරිගණක පාදක තොරතුරු පද්ධති 03ක් නම් කර ඒවායේ මූලික සංඝටක වෙන වෙනම දක්වන්න.

විෂය :- ඉතිහාසය

බ්‍රිතාන්‍යයන් ලංකාව යටත් විජිතයක් බවට පත් කර ගත් පසු ඔවුන් ලංකාවේ තම බලය තහවුරු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල වැදගත්ම ආණ්ඩුක්‍රම ප්‍රතිසංකරණය පිළිබඳ පහත ශිර්ෂ යටතේ කරුණු දක්වන්න.

1ප්‍රතිසංකරණය ඇති කිරීමට හේතු

2.කොමිසමේ සමාජිකයින්

3. එහි ප්‍රධාන යෝජනා

4.එහි වැදගත් කම

විෂය :- ව්‍යාපාර හා ගිණුම් අධ්‍යයනය

1. මූල්‍ය ප්‍රකාශන යන්න හඳුන්වා ගිණුම් කාලඡේදයක් සඳහා පිළියෙළ කරනු ලබන ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන 02 ක් නම් කරන්න
2. දළ ලාභය, විකුණුම් ආදායම සහ විකුණුම් පිරිවැය යන්න කෙටියෙන් හඳුන්වන්න.
3. වියදම් යන්න අර්ථ දක්වා වියදම් වර්ග කර දැක්විය හැකි ආකාර 04 ක් දක්වන්න

විෂය :- පුරවැසි අධ්‍යාපනය

ආණ්ඩුවේ විවිධ ස්තර ,මානව හිමිකම් හා යුතුකම් යන පාඩම් ඇසුරුකර ගෙන පහත වගුව සම්පූර්ණ කරන්න

1.ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන්

පොදු මංමාවත්	මහජන සෞඛ්‍ය	පොදු උපයෝගිතා සේවා

2.පළාත් සභා වල සහ පළාත් පාලන ආයතන වල ප්‍රයෝජන මොනවාද? ලියා දක්වන්න.

3.පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්ථර වල වගකීම් හා පුරවැසියාගේ වගකීම් හා යුතුකම් වෙන වෙනම ලැයිස්තු ගත කරන්න

4.අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ෛඑතිහාසික අවස්ථා කිහිපයකට නිදසුන් ඉදිරිපත් කරන්න.

5.මානව හිමිකම් වල ස්වභාවය අනුව බෙදා දැක්විය හැකි අයිතිවාසිකම් වර්ග 03 ක් සඳහන් කරන්න.

විෂය :- බුද්ධ ධර්මය

පාඩම :- බුදු දහමින් හෙළිවන සිතීමේ හා විමසීමේ නිදහස

(01). සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳ බුදු දහමේ ඇතුලත් සූත්‍රය කුමක්ද?

(02). "යමක් පිළිගත යුත්තේ කවර කරුණු පදනම් කරගෙන ද" යනුවෙන් බුදුන් වහන්සේ කේස පුත්ත වැසියන්ට දේශනා කළ කරුණු මොනවාද?

(03)."සිතා විමසා කටයුතු කිරීමෙන් ශිෂ්‍යයෙකුට යහපත් අනාගතයක් ගොඩ නඟා ගත හැකිය". විමසන්න.

විෂය :- සෞඛ්‍ය හා ශරීරික අධ්‍යාපනය

- නිවරදි ඉරියව් පවත්වා ගැනිම නිරත කාර්යයෙහි කාර්යක්ෂමතාවය වැඩි වීමට හා මනා පෞරුෂයක් ඇති වීමට හේතු වේ.

1. නිවරදි ඉරියව්වක් යනු කුමක්ද?
2. ඉරියව් සඳහා බලපාන ජීවයාන්ත්‍ර මූලධර්ම 05 ක් නම් කරන්න.
3. විසිකිරිම් ඉසව්වකදි ගුවනට මුදා හරින ක්‍රිඩා උපකරණයයක් ගමන් කරන දුර කෙරෙහි බලපාන සාධක මොණවාද?
4. යම් කිසි බරක් ඉහලට එසවිමේදි පවත්වා ගත යුතු නිවරදි ඉරියව් වල ලක්ෂණ 05 ක් ලියන්න.

විෂය :- භූගෝල විද්‍යාව

1. ශ්‍රී ලංකාවේ ජනවාසෳතිය පිළිබඳ කෙටි හැදින්වීමක් කරන්න.

විෂය :- පෙරදිග සංගීතය

කාර්ය පත්‍රිකාව-දෙවන වාරය

1. ‘‘කවුරුදෝ අර කවුලුවෙන් ‘‘ ගීතය සංගීතමය බුද්ධියට මුල් තැනක් දෙමින් දෙවරක් හොඳින් ශ්‍රවණය කරන්න.

2. 10 ශ්‍රේණියේදී ඔබ අධ්‍යයනය කල භෛරවී රාගයේ මධ්‍යලය ගීතය සර්පිනාවක් හෝ වෙනත් යතුරු පුවරු සංගීත භාණ්ඩයක් ඇසුරින් අනුවාදනය කරමින් ස්වර හා ගීතය වාදනය හෝ ගායනය සඳහා . හොඳින් පුහුණු වන්න.

නිර්දේශිත මධ්‍යලය ගීත - I) අහතොරි බාංකී

II) මනහර ගීත නාද ඇසේ

III) භවානී දයානී

IV) කෙසියෙ හලායිරේ කන්හයි

V) අදර සයුරකී මවගෙ සෙනේහේ

3. ඔබ උගත් මධ්‍යලය ගීතය සඳහා පහත දැක්වෙන මාත්‍රා 8 හා 16 තානාලංකාර වලින් ඔබට පහසු . තානාලංකාර 2ක් පුහුණු වන්න.

i) ස<u>රි</u> <u>ග</u>ම ප<u>ධ</u> පම / <u>ග</u>ම පම <u>ග</u> <u>රි</u> ස-/

ii) ස<u>රි</u> <u>ග</u>- <u>රිග</u> ම- / <u>ග</u>ම පම <u>ගරි</u> ස-

iii) ස<u>රි</u> <u>ග</u>- <u>රිග</u> ම- / <u>ග</u>ම ප- මප <u>ධ</u>- / ප<u>ධ</u> <u>නි</u>- <u>ධනි</u> ස- / <u>නිධ</u> පම <u>ගරි</u> ස- /

iv) ස<u>රි</u> <u>ග</u>ම ප<u>ධ</u> පම /<u>ග</u>ම ප<u>ධ</u> <u>නිධ</u> පම / ප<u>ධ</u> <u>නි</u>ස <u>නිධ</u> පම / <u>ග</u>ම පම <u>ගරි</u> ස- /

4. ඔබ උගත් භෛරවී රාගයේ මධ්‍යලය ගීතය හා තානාලංකාර 2ක් ගිත ස්වර ප්‍රස්ථාර කරන්න

චිත්‍ර කලාව

පරිසරය ආශ්‍රිත තේමා චිත්‍රයට නැගීම. මානව රූප හා සත්ව රූප අධ්‍යයනය කර චිත්‍ර නිර්මාණය.

"නියඟය ආ දා" යන මාතෘකාව

දළ සටහන සඳහා උපකාර කරගැනීමට ඔබගේ අත්දැකීමක් සිහියට නගන්න.

කඳුකර ජනතාව වතුර සොයා යන අවස්ථාවක්,/වියළි කලාපයේ ජනතාව වතුර සොයා යන අවස්ථාවක්,

පාරේ ගසක් යට වතුර බව්සරයක් එනතුරු සිටින පිරිසක්,/පාර අද්දර වතුර ටැංකියකින් පෝළිමේ ගොස් වතුර ගන්නා පිරිසක්,/සිඳිගිය වැවක් මැද දිය කඩිත්තකින් වතුර ගන්නා අය සහ වතුර බොන සතුන්,

ඉහල තේමාවන් චිත්‍රයට නැගීමේදී පරිසරය තුල වියළි බව ඇති කිරීම සඳහා

ගස් වියලි ඉපල් සහිතව ඇඳීම,/පොල් ගස්වල අත්තක් දෙකක් ඉහලට තබා අනෙක් අතු පහලට කඩාවැටුනු බව,/කෙසෙල් ගස් කඩා වැටුනු බව,/බල්ලන් වැනි සතුන්, පාර අයිනේ පින්තාලි,/පොඩි ළමයි වතුර භාජන සහිතව පාර අයිනේ සිටින අයුරු,/මෙහිදී අඳින මිනිස් රූප වතුර භාජන විවිධ අයුරින් තබාගෙන සිටිම,ඔසවාගෙන යාම හා පරිසරය දක්වා/ විවිධ අයුරින් උක්ත චිත්‍රයට ආලෝකයක් ඇතිකර ගැනීමට පිළිවන.වර්ණ ගැන්වීමේදී කහ දුඹුරු අළු වැනි උනුසුම් වර්ණ වැඩිපුර භාවිතයෙන් පරිසරයේ උනුසුම් බව ඇති කිරීමට හැකියාව පවතී. මීට අමතරව ඔබගේ අත්දැකීමක්ද චිත්‍රයට නැගීමට පිළිවන.

නාට්‍ය හා රංග කලාව

ක්ෂණික නිරූපණයෙහි යෙදීම

පිටපතකින් තොරව සීමිත කාලයක් තුල දෙනලද ඉඟියකට අනුව කිසියම් අවස්ථා නිරූපනයක් කිරීම ක්ෂණික නිරූපණයක් ලෙස හැඳින්වේ. මෙහිදී අවස්ථාවට හෝ සිද්ධියට අදාලව තම පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මණාත්මකව චරිත හා සිද්ධි ගෙඩනගා ගැනීම ක්ෂණිකව කල යුතුය.එමෙන්ම එය අභිනය භාවිතා කරමින් ඒ මොහොතේම රඟදැක්වීම කල යුතුය.මේ අනුව ක්ෂණිකව ලැබෙන මාතෘකා වලට අනුව පරිකල්පන ශක්තිය මෙහෙයවා ස්වකීය අත්දැකීම්ද පදනම් කරගෙන අනුකරණ මාර්ගයෙන් අවස්ථාවක් සිදුවීමක් හෝ චරිතයක් ප්‍රතිනිර්මාණය කිරීම මෙමගින් සිදුවේ.ක්ෂණික නිරූපනයෙහි යෙදීම තුලින් ඔබගේ නිරූපණ හැකියාවන් වර්ධනය කර ගත හැකිය.(සා පෙළ ප්‍රායෝගික පරීක්ෂණයේදීද ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීමට සිදුවේ).

ක්‍රියාකාරකම්

1. සුපිරි තරුවක් වීමට අපේක්ෂාවෙන් සිටින අයෙක්./2. දිව්‍ය ලෝකයේ ගිය ගමරාල./3. ශාස්ත්‍ර කියමින් මිනිසුන් රවටන පුද්ගලයෙක්.